# සංසාරය

සහ

# නිර්වාණය

පැළෑණේ ශ්‍රී වජ්‍රඥාන මහානායක
ස්වාමිපාදයන් වහන්සේ
විසින් ලියන ලදී.

---

ශ්‍රද්ධා සම්පන්න බෞද්ධ මහෝපාසක
ජ්. ජ්. ගබෝසිකෙළඳෝ මුදලාලි මහතාට
පින් පෙත් පිණිස
තත් පුත්‍ර
ජ්. ජ්. ස්ටීවන් පෙරේරා මහතා විසින්
මුද්‍රණය කරවා
ධර්මදූත වශයෙන් නොමිලයේ විසුරුවා හරින ලදී.

---


මහාබෝධි යන්ත්‍රාලයයෙහි මුද්‍රිත යි.

ශ්‍රී බු: ව: 2484
ක්‍රි: ව: 1940

# පුණ්‍යානුමෝදනාවක්

**පින්වත්නි,**

දැනට මම දැඩි ගිලන්ව මහාරෝග්‍ය ශාලාවෙහි වෙළඳ වාට්ටුවෙහි ප්‍රතිකාර ලබමින් ලෙඩ ඇඳේ සිටිමි. දැනට මම වයස අවුරුදු 80 ක් පමණ ගතකොට සිටින්නෙක්මි. කිසිවෙකුගේ තරාතිරම් නොසලකා කාටත් සාධාරණව පැමිණෙන ජරාවෙන් හා රෝදුකින් පෙළෙමින් ලෙඩ ඇඳේ සිටින මට මා විසින් කරණ ලද බොහෝ පින් ඇති බැවින් මතක ඇති තරමින් ඒ පින්කම් මතක් කොට මහජනයාට පින් අනුමෝදනාවක් කරන්නට අදහස් විය.

මම ස්වෝත්සාහයෙන් දියුණුවූවෙක්මි. වීර්‍යයෙන් ධනය සම්පාදනය කොට තරුණ විය ඉක්මෙන්නට ප්‍රථම තරමක ධනවතෙක්මි. එතැන් පටන් බොහෝ පින් දහම් කරන්නට පටන් ගතිමි.

කොළඹ ප්‍රසිද්ධ විහාරස්ථානයක්වූ **ශ්‍රී ලඞ්කාරාමය** සෑදීමට මූලිකව ක්‍රියා කොට එහි දියුණුව පිණිස බොහෝ වියදම් කෙළෙමි. අනතුරුව ලක්දිව උසස් ගුණවතකු මෙන් එකහෙළා පිළිගත් **සිරිධම්ම** මහාස්ථවිරපාදයන් වහන්සේ සම්මුඛවූ හෙයින් උන්වහන්සේගේ දායකත්වයට පැමිණ මගේ ඉඩමක අන්‍යයන්ගේද උපකාර ඇතිව අඞ්ග සම්පූර්ණ ආරාමයක් කරවා පුද උන්වහන්සේ ප්‍රමුඛ තිස්නමක් පමණ මහාසඞ්ඝයා වහන්සේට සිව් පසයෙන් උපස්ථාන කෙළෙමි. පසුව එම ආරාමය පිහිටි භූමිය ආණ්ඩුව ගත් හෙයින් තවත් සඞ්ඝාරාමයක් කරවීමේ කටයුතුවල යෙදෙන්නට වීය.

පළමු ආරාමය ආණ්ඩුවට ගත් මුදලින් නැවත දෙමටගොඩ ඉඩමක් මිලයට ගෙන ඉතා ඉක්මණින් සඞ්ඝාරාමයක් කරවන ලදී. එය කරවා අවසානවීමෙන් පසු ලෙයාර්ඩ්බ්‍රෝඩ් වීදියේ **ජේතවනාරාමය** පිහිටි භූමිය මුදලට ගෙන එය ගොඩකරවා අඞ්ග සම්පූර්ණ සඞ්ඝාරාමයක් බවට පැමිණ වූයෙමි. මවිසින් මෙසේ සඞ්ඝාරාම සතරක් මූලිකව කරවන ලදහ.

මට මේ සියලුම අවස්ථාවලදී බෞද්ධ මහාජනයාගේ ආධාරෝපකාරද ලැබිණ. එහෙත් මේ ආරාම සම්බන්ධයෙන් රුපියල් ලක්ෂයකට අධික මුදලක් පරිත්‍යාගකර තිබේ. මේ හැර මා විසින් ලක්දිව වෙනත් වෙහෙර විහාරස්ථාන පන්සල් වෙනුවෙන්ද පරිත්‍යාග කරණලද ධනය ඉතා බොහෝය.

සෑම වෙසක් පොසොන් පසළොස්වක් දිනයන්හිදී සියයක් පමණ අසරණ දුප්පත් අයට ආහාරයෙන් හා රෙදිපිළි මිළ මුදලින් ආධාර කරගෙන ආයෙමි.

මගේ දිනචරියාව වශයෙන් කුඩා කල පටන් මේ දක්වාම අළුයම හතරට නැගිට තුනුරුවන් වැඳීමත් සවස තුනුරුවන් වැඳීමත් පුරුදු කොළෙමි. ධර්මපොත් පත් බොහෝ ගණනක් මුද්‍රණය කරවා ධර්මදානය වශයෙන් නොමිළයේ පරිත්‍යාග කොළෙමි.

ලක්දිව ප්‍රසිද්ධ ගුණවතුන් හැටියට පිළිගත් අරණ්‍යවාසී **සීලානන්ද, වඩුවත්තේ උපසේන** යන මහාස්ථවිර වහන්සේලා නවත්වාගෙන උපස්ථාන කොළෙමි. දඹදිව හා ලක්දිව සියලු පූජනීය ස්ථාන කරා පැමිණ වැඳ පුදගතිමි.

තවද බෞද්ධ අධ්‍යාපනයට ආධාරයක් වශයෙන් කොළඹ නාලන්ද විද්‍යාලයෙහි මවිසින් කාමරයක් ගොඩ නංවන ලදී.

ලාදුරු ආරෝග්‍යශාලාව, කාශ ආරෝග්‍යශාලාව, අනාථමඩම්, මහළුමඩම්, ආදියෙහි වෙසෙන අසරණයන් උදෙසා බොහෝවර ධන පරිත්‍යාග කොළෙමි. එසේම රජරටේ ජනපද පිහිටුවීමේ ව්‍යාපාරයට ආධාරයක් වශයෙන් කීපවතාවක් ඒ අලුත් ජනපද වාසීන්ට රෙදිපිළි බෙදාදීමෙන් සංග්‍රහ කොළෙමි.

බොහෝ කලක් මුළුල්ලෙහි සිල් සමාදන්වන උවසු උවැසියන් හට දාන මානාදියෙන් සංග්‍රහ කොළෙමි. මරණානුස්මෘතිය, මෛත්‍රී භාවනාව හා ආනාපාන සතිය භාවිතා වශයෙන් පුරුදු පුහුණු කොළෙමි.

මෙසේ උගත් සුපෙශල භික්ෂු සඞ්ඝයා ආශ්‍රය කරමින් ශාසනය පවත්නා කාලයෙහි දුකසේ ලැබූ මනුෂ්‍යාත්මභාවය සඵලකර ගන්නා අදහසින් මම මේ ශාසනයෙහි බොහෝ පින්කම් කොළෙමි.

ඒ මා විසින් සිත කය වෙහෙසීමෙන්ද ධන පරිත්‍යාග කිරීමෙන්ද රැස්කර ගන්නාලද පුණ්‍යසම්භාරය දෙවියන් සහිත සියළු බෞද්ධ ජනකායටද හිතාහිත මැදහත් සියලු සත්වයින්ටද අනුමෝදන් කරවමි.

ඒ සියලුදෙනාම මේ පින් අනුමෝදන්ව තම තමන් නිවන් සිරි පතමින් මගේද සුවපත් බව පතනමෙන් කරුණා මෛත්‍රී පුරස්සරව ඉල්ලමි.

මීට—රෝගාතුරව සිටින,

ඒ. ඒ. ගබෝසිංහ [illegible]

# සංසාරය

මෙහි '**සං**' යන උපසර්ගය- නැවැතැ නැවැතැ- යන අර්ථය ද, ගමනාර්ථවූ '**සර**' ධාතුයෙන් සිද්ධ '**සාර**' ශබ්දය යැම-යන අර්ථය ද ප්‍රකාශ කරන හෙයින් = **ජාතියෙන් ජාතියට මැරීම් ඉපැදීම් වශයෙන් නැවැතැ නැවැතැ යැම** - යන අර්ථයෙන් "සංසාර" යැ යි කියනු ලබන්නේ:

සාමාන්‍ය ලෝකයා විසින් "සත්ත්වයා" යැ යි සිතනු ලබන අනාදිමත් = මූලක් නැති කාලයෙකැ සිටැ ක්ෂණයක් පාසා සිඳී සිඳී බිඳී බිඳී නැවැතැ නැවැතැ ත් වැල නො කැඩී උපදිමින් කිසි කලෙක ත් විච්ඡේදයකට (=සහමූලින් සුන් වීමකට) නො පැමිණැ පිරිනිවන් පෑම දක්වා ම පැවැතෙන නාම රූප ස්කන්ධ සන්තානය යි- හෙවත් - වේදනා - සංඥා - සංස්කාර - විඥාන - යන නාමස්කන්ධ සතර යැ - රූපස්කන්ධය යැ - යන පස් වැදෑරුම් ස්කන්ධයන්ගේ සන්තතිය යි = පරම්පරාව යි.

මෙහි අටවිසි (= 28) වැදෑරුම් රූපයන්ගෙන් එක් සත්ත්වයකුගේ සන්තානයෙහි ස්ත්‍රීභාවරූප යැ පුම්භාවරූප යැ යන දෙක ම එක් විටෙකැ නොලැබෙන හෙයින් ස්ත්‍රීසන්තානයෙකැ නම් ස්ත්‍රීභාවරූපය ත් සමඟ සත්විසි (=27) රූපයක් ද, පුරුෂසන්තානයෙකැ නම් පුම්භාවරූපය ත් සමඟ සත්විසි (=27) රූපයක් ද නානාකලාපයන් පිළිබඳ වැ කර්මාදි ප්‍රත්‍යය සතරෙකින් චිත්තක්ෂණයක් පාසා වැල නො කැඩී ඉපැදීම් වශයෙන් නොයෙක් ලෙසින් ලැබියැ හැකි යැ.

එහෙත්, එයින් විඤ්ඤත්ති-ලක්ඛණ රූපයන් චිත්තක්ෂණයක් පාසා ද, අනෙක් හැම රූපයන් චිත්තක්ෂණ සතළොසක් (=17) පාසා ද බිඳී බිඳී යන හෙයින් අනිත්‍ය වුව ත් බිඳෙන බිඳෙන අතරැ වැල නො කැඩී අමුතු අමුතු රූපයන් උපදනා හෙයින් රූපසන්තතිය අවිච්ඡින්න වේ. (=රූපපරම්පරාව සහමූලින් සුන් නො වේ.) නාමස්කන්ධ සතර අතුරෙන් 'විඥාන' නම් චිත්තය යි, වේදනා-සංඥා-සංස්කාර-යන තුන් කඳු ම චෛතසික යි - හෙවත්- ඒ ඒ සිත්හි යෙදෙන දෙ පනසක් (=52) පමණ චිත්තාඞ්ගයෝ යි. ඒ ඒ චෛතසිකයෝ ඒ ඒ සිත්හි උපදනා කලැ ඔවුන් සමඟ එක් වැ මැ ඉපිදැ බිඳෙනා කල ත් එක වරැ ම බිඳෙති.

මේ චිත්ත චෛතසිකයන්ගේ ඉපැදීම් බිඳීම් යටැ කී රූපයන්ගේ ඉපැදුම් බිඳුම්වලට වඩා සතළොස් (=17) වරක් ඉක්මන් වෙති.

මේ චිත්ත චෛතසිකයන්ගේ ආයුෂය කො තරම් ලුහුඬු දැ? යි දක්වන්නට උපමාවක් වත් සොයා ගැනීම දුෂ්කර යැ යී බුදුන් වහන්සේ ම වදාළ හෙයින් ඒ නාමස්කන්ධයෝ සතර දෙන විදුලි යක සොළොස් (=16) වන කලාවට ත් කුඩා ක්‍ෂණයක් ඇතුළතැ ඉපිදැ–සිටැ–නැසී යෙති

එක් චිත්තක්‍ෂණයක් ඇතුළතැ දෙසිතෙක් නැති. එ බඳු කුඩා ක්‍ෂණ දෙකක් මුළුල්លේ පැවැත්ත හැකි තරම් දික් වූ ආයුෂ ඇති එක සිතෙකු දු නැති. එ හෙයින් නාමස්කන්ධ සතර වූ චිත්ත චෛතසිකයෝ ක්‍ෂණභඞ්ගුරයහ – හෙවත් – එක චිත්තක්‍ෂණයක් ඇතුළතැ ම ඉපිදැ බිඳී යන ස්වභාවය ඇත්තාහ.

එහෙත්, එක් චිත්තයක්හුගේ බිඳී යැම හා ඊළඟට උපදනා චිත්තයාගේ උදාවීම ත් යන දෙකෙහි අතරක් නැත. එකක් බිඳෙන්නා හා සමඟ ම අනෙක් සිත උපදී. මේ නියායෙන් නාම ස්කන්ධ සන්තතිය ද අතිශයයෙන් අනිත්‍ය වුව ත්, අතර නො දක්වා වර නො දක්වා පිරිනිවීම තෙක් ම වැල නො කැඩී නැවැතැ නැවැතැ උපදනා හෙයින් නාමසන්තතිය ද අවිච්ඡින්න වේ. මේ චිත්ත චෛතසික නම් වූ නාමධර්මයන්ගේ ක්‍ෂණභඞ්ගය (=මොහොතක් පාසා බිඳී බිඳී යන බව) නොදතුවෝ "සිත ආත්මය යැ– හැම කල්හි නො නැසී පවත්නේ යැ" යන ආදීන් මිථ්‍යාදෘෂ්ටි ගනිති.

යම්සේ අනාදිමත් කාලයෙකැ සිටැ පැවතෙන මහ මුහුදෙහි රළ නොනැඟෙන නොබිඳෙන මොහොතක් නැත්තේ ද? නැඟෙන නැඟෙන රළ එ තැනැ එ තැනැ ම බිඳෙත ත් අමුතු අමුතු රළ අතර නො දක්වා ම නැඟෙන බැවින් රළ සන්තතිය =රළ පරම්පරාව=රළ පෙළ ලොකවිනාශය තෙක් ම කිසි කලෙක ත් විච්ඡින්න නො වේ ද? =සහමුලින් සුන් නො වේ ද?) එ මෙන් සාමාන්‍ය ලොකයා විසින් සත්ත්වයා යැ යි කියනු ලබන නාම රූප ධර්ම සංඛ්‍යාත පඤ්ච උපාදානස්කන්ධ සන්තතිය (=උපාදානස්කන්ධයන් පස් දෙනා පිළිබඳ පරම්පරාව)ක්‍ෂණයක් පාසා බිඳෙත ත් පිරිනිවිය දක්වා ම අතරක් නොපෙනෙනසේ නැවැතැ නැවැතැ නැඟෙන හෙයින් අවිච්ඡින්න වේ.

මෙසේ එකිඑකී ධර්මයාගේ වශයෙන් අනිත්‍ය ත් වූ සකල නාම රූප ධර්ම සන්තානයාගේ වශයෙන් උච්ඡෙද ත් නො වූ සන්තතියෙහි අතීතයෙහි බිඳී ගිය තාක් රූපරාශිය ද, දැන් පවත්නා නානා

කලාපගත (=නොයෙක් වෙනස් රූපකලාපයන්හි ඇතුළත් වූ) රූප රාශිය ද, මතු දු පැවැත්ත හැකි රූප රාශිය ද යි යනා ආදීන් එකොළොස් කොටසකට බෙදා වදාළ තාක් හැම රූපයන් සිතින් එක් කොට සලකා රූපස්කන්ධ යැ යි කියනු ලැබේ.

සතර නාමස්කන්ධයන්හි දු ‘‘ස්කන්ධයන්’’ = ‘‘රාශිහු’’ යැ යන ව්‍යවහාරය ලැබෙන්නේ මේ අතීතානාගතාදි හැම කොටස් ම එක් කොට සිතින් සලකා ගන්නා නියෙන් මැ යි.

**මෙසේ අනාදිමත් කාලයෙහි සිට ක්ෂණයක් පාසා බිඳෙන බැවින් අනිත්‍ය ද වෙමින්, සහමුලින් සිඳී සුන් නොවන බැවින් උච්ඡින්න ද නො වෙමින් පරම්පරා වශයෙන් පැවැත්තෘ එන නාම-රූප-ස්කන්ධයන්ගේ සන්තතිය (=පරිපාටිය) සංසාර යැ යි කියනු ලැබේ.**

මෙහි රූපයෝ භූතරූප උපාදාය රූපයන්ගේ වශයෙන් නානාකලාපයන්ගේ වශයෙන් ද, නාමයෝ චිත්ත චෛතසික යන්ගේ වශයෙන් භවාඞ්ගසන්තති- වීථි- චිත්තොත්පාදයන්ගේ වශයෙන් ද, ඔවුනොවුන් බැඳී සූවිසි වැදෑරුම් ප්‍රත්‍යයයන්ගේ වශයෙන් ඔවුනොවුනට උපකාර වෙමින් පැවැතෙත්.

නිර්වාණයාගේ එබඳු මිශ්‍රීභාවයක් සංයුක්තභාවයක් නැති හෙයින් එය ‘‘අසම්මිශ්‍ර’’ යැ- ‘‘කෙවල’’ යැ යි කියනු ලැබේ. එය මේ ස්කන්ධසන්තානය හා මුසු නොවතු දු හුදෙ'කළා වතු දු මෙහි මැ පිළිබැඳි වැ (=මේ පඤ්චස්කන්ධයෙහි ම පිළිබඳ කම් ඇත්තක් වැ) මෙය ම විෂය කොට (=මේ පස්කඳ ම ආශ්‍රය ස්ථාන කොට) ඇත්තේ යැ.

**‘‘අපි චා ‘හං ආවුසො ඉමස්මිං යෙව ව්‍යාමමත්තෙ කළෙවරෙ සසඤ්ඤම්හි සමනකෙ -පෙ- ලොකනිරොධඤ්ච පඤ්ඤපෙමි’’** යනා ආදීන් මේ සිත් සත් ඇති ශරීරය ම විෂය කොට ‘‘ලොකනිරොධ’’ නම් වූ නිවන ත් පනවමැ යී වදාළ බුදු බණෙන් ද, **‘‘නිරොධ සච්ච ම'සම්මිස්සං’’** යනා ආදි අර්ථකථාවචනයෙන් ද ඒ බව පැහැදිලි වේ. යම් කලෙක එය ස්කන්ධසන්තාන නම් වූ සංසාරයෙන් මිදී ඒ කෙවලධර්මමාත්‍රය වී නම් එය සංසාරමුක්ති යැ යි කියනු ලැබේ. එය රහත් වීමෙන් **සඋපාදිසෙස** වශයෙන් ද, පිරිනිවීමෙන් **අනුපාදිසෙස** වශයෙන් ද සැලැසේ.

**‘‘කායස්ස භෙදා ධම්මට්ඨො-සංඛ්‍යං නො'පෙති වෙදගූ’’**

යනුයෙන් රහත් තෙමේ කායයාගේ භෙදයෙන් (=මරණයෙන්) මතුයෙහි ධර්මස්ථ වේ=නිවන්හි පිහිටියේ වේ. දෙව බ්‍රහ්මාදි සත්ත්ව සංඛ්‍යාවකට නො පැමිණේ යැ යි වදාළේ එ හෙයිනි.

බුද්ධාගමය අනිත්‍යවාදී ත් වෙමින් අනුච්ඡේදවාදී ත් වන්නේ මේ හෙයිනි.

"නාම රූප ධර්ම සන්තානයක් මිස, සත්ත්වයෙක් පුද්ගලයෙක් නැත."

"පිරිනිවියේ උච්ඡින්න නො වේ"

"නිර්වාණය ශූන්‍යභාවමාත්‍රය නො වේ"

"උත්පාදයිතව්‍ය (=හෙතු ප්‍රත්‍යයයන්ගෙන් අමුතුවෙන් ඉපැදැවිය හැකි) ධර්මයෙකු දු නො වේ."

"එහෙත්, ප්‍රාප්තව්‍ය ධර්මයෙක (=ආර්‍ය්‍යමාර්ගයෙන් ප්‍රත්‍යක්‍ෂ කොට පැමිණියැ යුතු වූ සවභාවයෙන් ම හැම කල්හි විද්‍යමාන වූ දෙයෙක" යන ආදිය දක්වෙන්නේ මේ හෙයිනි.

මෙහි "සන්තති"යැ, "සන්තාන"යැ, "පරිපාටි"යැ, "පරම්පරා" යැ යි කී සතර පදයෙන් මැ කියැවෙන්නේ එක ම දෙයෙකි.

එනම්: කෙණෙහි කෙණෙහි බිඳෙමිනු දු සහමුලින් සුන් නො වී නො කැඩී වැලක් මෙන් පැවැත් ම ය. නැවැතැ නැවැතැ යන අර්ථ ඇති "සං" – යන උපසර්ගයෙනු ත් විස්තරාර්ථ වූ-හෙවත්-මතුමතුයෙහි පැතිරීම=ලියලීම= යන අර්ථ ඇත්තා වූ "තනු" ධාතුයෙන් සිද්ධ වූ "තාන-තති" ශබ්දයන්ගෙනු ත් යන දෙ කොටසින් ම කියැවෙන්නේ: අවිච්ඡින්න වැ මතුමතුයෙහි පැතිර යෑම=ලියලීම-සනු යි.

එ හෙයින් "සං + තාන, සං + තති" යන ශබ්දයන්ගෙන් කෙණෙහි කෙණෙහි බිඳුණ ත් එ තෙකින් උච්ඡින්න නො වැ නැවැතැ නැවැතැ පැනැ නැගෙමින් මතු මතුයෙහි ලිය ලීම= පැතිර යෑම=වැල නො කැඩී මතුමතුවට පැවැත්ම යන මේ නිර්වචනාර්ථය (=අක්‍ෂරචාරයෙන්= අකුරු මඟින්-ගෙනැ හැර පෑව යුතු අර්ථය=තේරුම) ලැබේ.

"පරි"-උපසර්ගයා පූර්ව කොට ඇති වෙළීම හෝ ගමන අර්ථ කොට ඇති පට – ධාතුයෙන් සිද්ධ වූ "පරිපාටි" – ශබ්දයෙන් ද, "ඔබින් ඔබට යෑම-නොහොත්-අනෙකෙකින් අනෙකෙකට යෑම" යන අර්ථයෙහි සිද්ධ වූ "පරම්පරා" ශබ්දයෙන් ද ඒ සන්තානාර්ථය ම කියැවේ.

යටැ දක්වූ පරිදි ඉතා කොටින් කියතොත් අනාදිමත් කාල යෙකැ පටන් අනන්තකාලයක් මුළුල්ලේ වැල නො කැඩී පැවැතැ එන නාම රූප ධර්ම සමූහයන්ගේ සන්තානය=පරිපාටිය=පරම්පරා වශයෙන් නො සිඳී පැවැත්ම ''සංසාර''යැ සි ද, එයට මඳක් විස්තර කොටැ කියතොත් පස්වැදෑරුම් උපාදානස්කන්ධයන්ගේ වශයෙන් ද එයට ද වඩා විස්තර කොටැ කියතොත් දොළොස් වැදෑරුම් ආයතනයන්ගේ වශයෙන් ද, එයට ත් වඩා විස්තර කොටැ කියතොත් අටළොස් වැදෑරුම් ධාතූන්ගේ වශයෙන් ද,

නාමරූපසංසාර යැ,
ස්කන්ධසංසාර යැ,
ආයතනසංසාර යැ
ධාතුසංසාර යැ,

යි සතර වැදෑරුම් කොටැ දක්විය හැක්කේ යැ. එහෙයින් දම්සඟුණු අටුවාහි (= අත්ථසාලිනියෙහි):

**''ඛන්ධානං ච පටිපාටි-ධාතු ආයතනාන ච**
**අබ්බොච්ඡින්නං වත්තමානා-සංසාරෝ'ති පවුච්චති''**-යි

සංසාරය ත්‍රිභෙද කොටැ (=බෙදුම් තුනක් ඇති කොටැ) දක්වූහ.

''අබ්බොච්ඡින්නං වත්තමානා ඛන්ධානං පටිපාටි ච, ධාතූනං පටිපාටි ච, ආයතනානං පටිපාටි ච සංසාරො ඉති පවුච්චති''-යනු මෙහි පද සැසැඳීම යි.

අව්‍යවච්ඡින්න වැ (=සහමුලින් නො සිඳී= වැල නො කැඩී කෙණෙහි කෙණෙහි බිඳි බිඳී) පවත්නා වූ පස්වැදෑරුම් නාම රූප ස්කන්ධයන්ගේ හෝ අටළොස් වැදෑරුම් නාම රූප ධාතූන්ගේ හෝ දොළොස් වැදෑරුම් නාම රූප ආයතනයන්ගේ හෝ පිළිවෙළ (=අනුක්‍රමයෙන් පැවැතෙන පරම්පරාව=සන්තතිය) සංසාර යැ යි කියනු ලැබේ-යනු භාවයි.

# නිර්වාණය.

## "නිබ්බානං පරමං සුඛං"

### (ඉතා ම උසස් සුවය නම් නිවන යි)

මේ බුද්ධවචනයෙන් -'නිවනට වැඩි සුවයෙක් නම් කොහි වත් ඇත්තේ ම නැත'- යනු ප්‍රකාශ වේ. එහෙත් ඒ වෙදයිත සුඛයෙක් නො වේ-හෙවත්- සුඛවේදනාවගේ වශයෙන් කායද්වාරයෙන් හෝ මනොද්වාරයෙන් හෝ විඳිය හැකි සුවයෙක් නො වේ.

**"තෙසං වූපසමො සුඛො"** යි වදාළ පරිදි වේදනාවන් පමණක් නො වැ සියලු ම සංස්කාරධර්මයන් නැවැත නූපදනා පරිදි සංසිඳීමෙන් පැමිණියැ යුතු වූ ව්‍යපශම සුඛයෙකි.

වේදනාවන් චෛතසික වන බැවින් චිත්තක්ෂණයක් පාසා බිඳෙනසුලු වූ වෙදයිතසුඛයෝ ක්ෂණභඞ්ගුර වෙති. (=කෙණෙහි කෙණෙහි බිඳෙනසුලු වෙති.) එහෙයින් අනිත්‍යයහ. එහෙයින් ම "යද'නිච්චං තං දුක්ඛං" (=යමක් අනිත්‍ය නම් හේ දුකැ) යි වදාළ පරිදි දුඃඛයහ. අනිත්‍ය දුඃඛ ස්වභාවය ඇත්තවුන් ආත්මයහ යි නො ගත යුතු වන හෙයින් අනාත්මයහ.

ව්‍යුපශමය වූකලි උපදිමින් සිටිමින් බිඳෙමින් සන්තති වශයෙන් පවත්නා ධර්මයෙක් නොවේ. කොටස් වශයෙන් බෙදියැ හැක්කේ ද නො වේ. එහෙයින් ස්කන්ධසංග්‍රහයෙහි ඇතුළත් නො වේ. හෙතු ප්‍රත්‍යයයන් විසින් සංස්කරණයක් (=සම්පාදනයක්=පිළියෙල කිරීමක්) නොකරන ලද හෙයින් 'සංඛත' ද නො වේ. අසංඛත වන බැවින් ම උත්පාදයක් වත්, භඞ්ගයක් වත් ඇත්තේ ද නො වේ. එහෙයින් ම නාම යැ යි හෝ රූප යැ යි කියැ යුතු ද නො වේ. එහෙත්, ඒකාන්තයෙන් විද්‍යමාන වූ, හැම කල්හි නිත්‍ය වූ, භෙද (=බෙදුම්) නැති බැවින් එකක් ම වූ, දෙ සැත්තෑවක් වස්තුධර්මයන්හි ඇතුළත් වූ, මාර්ග ඵල චිත්තයනට අරමුණු වන්නා වූ ලොකොත්තර ධර්මයෙකි.

**"පරමත්ථතො හි දුක්ඛනිරොධං අරියසච්චන්ති නිබ්බානං වුච්චති..."**

යනු විශුද්ධිමාර්ගයෙහි සත්‍යනිර්දේශයෙහි ආයේ ය. "පරමාර්ථ වශයෙන් නම් දුඃඛනිරොධාර්‍යසත්‍යය යැ යි කියැවෙන්නේ නිවන යැ" යනු එයින් හැඟේ.

**''අපිචා'හං ආවුසො ඉමස්මිං යෙව ව්‍යාමමත්තෙ කළෙබරෙ සසඤ්ඤම්හි සමනකෙ ලොකඤ්ච පඤ්ඤපෙමි, ලොකසමුදයං ච ලොකනිරොධං ච, ලොකනිරොධගාමිනිං ච පටිපදං....''**

යන මේ දෙවපුත්තසංයුත්තයෙහි රොහිතස්ස සූත්‍රයෙහි වදළ බුද්ධවචනයෙන් ද,

**'කළෙබරෙති-** අත්තභාවෙ. **සසඤ්ඤම්හි සමනකෙ'ති** සසඤ්ඤෙ සචිත්තෙ. **ලොකන්ති**-දුක්ඛසච්චං. **ලොකසමුදයන්ති**- සමුදයසච්චං. **ලොකනිරොධන්ති**- නිරොධසච්චං. **පටිපදන්ති**- මග්ගසච්චං. ඉති නා'හං ආවුසො ඉමානි චත්තාරි සච්චානි තිණකට්ඨාදිසු පඤ්ඤපෙමි. ඉමස්මිං පන චාතුම්මහාභූතිකෙ කායස්මිං යෙව **පඤ්ඤපෙමී'ති දසෙසති'....**

යන මේ තදර්ථකථා ප්‍රදේශයෙන් ද චතුස්සත්‍යය පනවා, වදාළේ ගස් ගල් ආදි අනින්ද්‍රියබද්ධ සන්තානයන් විෂයකොට නො වැ ඉන්ද්‍රියබද්ධ වූ ස්කන්ධසන්තතිසංඛ්‍යාත වූ ආත්මභාවයන් විෂය කොටැ මැ යැ යනු ගැහෙයි. එසේ කල්හි නිර්වාණය ස්කන්ධ සඞ්ග්‍රහයට නො ගැනෙතු දු ස්කන්ධසන්තතීන් විෂය කොටැ මැ පැනැවූ බැවින් ස්කන්ධසන්තතීන් පිළිබඳ මැ යැ- යනු සිද්ධ වේ. (=ස්ඵුට වේ- ඔප්පුවේ.) ඉන්ද්‍රියබද්ධ වූ ස්කන්ධසන්තතීහු නම් ලොක ව්‍යවහාර වශයෙන් කියත් හොත්: සත්ත්වයෝ යි. මෙසේ නිවන් ඒ ඒ සත්ත්වයන් පිළිබඳ බැවින් කොතෙක් දෙනා නිවන් පැමිණි යත් එයින් නිර්වාණයාගේ පිරීමෙක් හෝ අඩුවෙක් නො පෙනේ. සත්ත්වවිෂය අප්‍රමාණ වන බැවින් දිශාදෙශ ව්‍යවස්ථා වශයෙන් (=අසුවල් දිශායෙහි හෝ දෙශයෙහි තිබේ ය යි නියම කිරීම් වශයෙන්) නොදැක්වියැ හැකි බැවින් නිවන ද අප්‍රමාණ වේ. අනන්ත වේ. අසුවල් දිශායෙහි යැ- අසුවල් දෙශයෙහි යැ-යි ව්‍යවස්ථා කොට නො දැක්වියැ යුතු වේ.

ගිනි ඒකාන්තයෙන් විද්‍යමාන වූ වස්තුවක් වුව ද "අසුවල් දිශායෙහි අසුවල් දෙශයෙහි අසුවල් ස්ථානයෙහි රැස් වී තිබේ යැ"යි නො කියැහැකි යැ. විධි වූ පරිදි යෙදූ ගිනි ගානා දඬුයෙන් ඇත්තා ම වූ ගිනි ප්‍රකාශයට පැමිණේ (මෙහි ගිනි ගානා දඬු වෙනුවට දැන් ප්‍රචලිත වැ පවත්නා ගිනිකූර ත් පෙට්ටිය ත් යොදා ගත් කලැ මේ උපමාව කාලානුරූප වැ හොඳින් වැටැහේ.) එසේ ම යම් සත්ත්ව

සන්තානයෙක්හි විධි වූ පරිදි යෙදුණු මධ්‍යම ප්‍රතිපදායෙන් නිත්‍යයෙන් විද්‍යමාන වූ ම නිර්වාණය ප්‍රත්‍යක්ෂ කටැ හැකි වේ. ඇත්තාම වූ ගින්නට (ප්‍රත්‍යක්ෂ කරණ වශයෙන්) ළඟා වනු මිස, අමුතුවෙන් ගිනි ඉපැදවීමක් නැත්තාසේ, ඇත්තාම වූ නිවනට (ප්‍රත්‍යක්ෂ කරණ වශයෙන්) ළඟා වනු මිස, අමුතු නිවන් ඉපැදවීමෙක් නැත්තේ යැ.

එ හෙයින් ම විශුද්ධිමාර්ගයෙහි: **"පත්තබ්බමෙ'ව හේ'තං මග්ගේන, න උප්පාදේතබ්බං"** (=මේ නිවන තෙමේ සෝවාන් ආදි සතර වැදෑරුම් ආර්යමාර්ගයෙන් ප්‍රත්‍යක්ෂ කිරීම් වශයෙන් පැමිණියැ යුතු ම- ළඟා වියැ යුතු ම වේ. අමුතුවෙන් ඉපැදවියැ යුත්තෙක් නො වේ යැ)යි කියන ලදී.

සුවාසූ දහස් තැනෙකැ සුවාසූ දහස් ගිනි ගාතා දඬුයෙකින් පහළ වුව ද එක ම ගිනි මුත්, වෙන වෙන ගිනි යැ යි නොකියැ යුතුවා සේ, කොතෙක් දෙනා නිවන් පසක් කළ ත් නොයෙක් නිවනැ යි නො කියැ යුතු. එක නිවනැ යි ම කියැ යුතු යැ. නිවන් සොයාගත් බුදුන් වහන්සේ ද- තදුපදෙශයෙන් (=උන් වහන්සේගේ අනුශාසනානුසාරයෙන්) මඟ නුවණැසින් එය ප්‍රත්‍යක්ෂ කොටැ දැකැ ගත් රහතන් වහන්සේ ද නොයෙක් තැනැදී "නිවන් එකාන්තයෙන් විද්‍යමාන වන බව ත්, පරම සුඛ වන බව ත්" වදාළ පමණ මුත්, නිර්වාණයාගේ ස්වරූප විවරණයක් නොකළ සේක. ඉතා ම සියුම් වූ ධර්මයක් වන බැවින් තමන් තමන් සතන්හි උපදවා ගත් ලොකොත්තරඥාන චක්ෂුසින් තමන් තමන් විසින් ම එය තතුපරිදි දැකැ ගත යුතු වන බැවිනි.

එ හෙයින් ම විශුද්ධිමාර්ගයෙහි: **"සරූපෙනෙ'ව සක්කා න වත්තුන්ති ච 'අතිසුඛුමත්තා'**- (=ස්වරූපයෙන් ම- ඇති ස්වභාවයෙන් ම හෙළි කොටැ නො වදාළේ කවර හෙයෙකින් ද යත්? ඉතා සියුම් වන බැවිනැ) සි කීහ. නිවන්රස තබා තිරිසන් සත්නට ත් සාධාරණ (=පොදු) වූ පැණිරස ආදි රසයන්ගේ පවා ඇති තතු තමන් තමන්ගේ දිවෙන්ම යථා ස්වභාවයෙන් දත යුතුවා මිස, අනුන්ගේ වචනමාත්‍රයෙන් නො දත හැකි වේ. එ හෙයින් "අතිශය සූක්ෂම වූ නිර්වාණයාගේ සුඛතත්ත්වය තමන් තමන්ගේ ම ලොකොත්තර මාර්ගඥාන චක්ෂුසින් ම දක්කැ යුතු යැ" යන මෙහි කවර කථා යැ?

බුදුන්වහන්සේ විසින් නිර්වාණධර්මය "සන්දිට්ඨික"යැ යි වදාළේ මේ හෙයිනි. තමා විසින් ම- තමාගේ නුවණැසින් ම දැකැ ගත යුතු යැ. අනුන්ගෙන් අසා ගත් පමණෙකින් ස්වරූපාවබොධ

වශයෙන් තතු නො දක්නා හැකි යැ- යනු ඒ පදයාගේ අර්ථය වේ. ඒ බුඞවචනයට අනු වැ පිළිපදනා යොගියකු විසින් ක්‍රම යෙන් දියුණු කොටැ පරමකොටියට (=ඉහළ ම කොනට) පමුණුවා ගත් විදර්ශනා ඥානයෙන් මතුයෙහි පහළ වන ලොකොත්තර වූ මාර්ගඥාන චක්‍ෂුසින් තමා විසින් ම එය දක්නා ගත යුතු වේ.

බුදුන් වහන්සේ බුදු වැ පළමු වැ මුළු සත්ත්වලොකය බලා වදාරන කල්හි **"ඉදම්පි ඛො ඨානං සුදුද්දසං යදිදං සබ්බසඞ්ඛාර සමථො"** යන ආදීන් "මේ නිවන නම් ලෞකික මහාජනතාව විසින් ස්වකීය ඥානයෙන් දක්නා ගන්නට අතිශයින් ම දුෂ්කර වූ කාරුණෙකැ" යි දක්නා වදාළ සේක් මැ යැ.

මෙසේ කියන කල්හි පෘථග්ජන වූ මන්දශ්‍රද්ධ වූ (=මද සැදැහැ ඇත්තා වූ) සමහර කෙනකුනට "එසේ නම්- ඒ නිවන ස්ඵුට කොටැ නො දක්නියැ හැකි නමක් පමණක් ම වනු මිස, එයින් කියැවෙන දෙයක් නැති බැවින් හුදෙක් ප්‍රඥප්තිමාත්‍රයෙක් මැ යැ" යන හැඟීමෙක් ඇති වියැ හැක්ක. එය වූ කලී නිවන් පෙනෙන ඇසු ත් (=මාර්ගඥාන චක්‍ෂුසු ත්) නැති- ඒ ඇස් ලත් බුදුන් රහතන් බසු ත් නො අදහන- යුක්ති වශයෙන් අනුමිති කොටැ සිතන්නට තරම් වූ ප්‍රෞඪ බුද්ධියකු ත් නැතියවුන්ගේ ශුෂ්කතර්කානුගත වූ නිගමනයෙකි.

මේ නිවන තර්කයෙන් බැසැ ගත හැක්කක් (=විවෙචනය කොටැ තීරණයට පැමිණියැ හැක්කක්) නො වන හෙයින් "අතර්කාවචර" යැ යි බුදුන් වහන්සේ වියින් මැ වදාරන ලද්දේ ශුෂ්කතර්කානුසාරයෙන් නොමඟ යනුවන් වළක්වනු සඳහා මැ යැ. මෙ බඳු සියුම් ගැඹුරු ලොකොත්තරාර්ථයක් තබා, ලෞකික වූ ඖදාරික (=ගොරෝසු) දේවල් අතර ද තර්කයෙන් තීරණය නො කටැ හැකිවූ දේවල් බොහෝ වෙති. උක්පැණි මීපැණි කිතුල් පැණි ආදි මධුර රසවත් ද්‍රව්‍යයන්ගේ එකෙකින් එකකට ඇති වෙනස දිව නම් වූ ඉන්ද්‍රියයට ප්‍රත්‍යක්‍ෂ කොටැ මැ (=කා බලා මැ) මිස, තර්කයෙන් තීරණය කටැ හැකි නො වේ. 'තර්කය' නම් සමහර ලෞකිකාර්ථයන් මැනැ තීරණය කැරැ ගැනීමට විඥයන් විසින් තනා ගත් උපකරණයෙකි. ගල් බොරළු මනින උපකරණය වූ කුඹයෙකින් ජලය නො මැනියැ හෙන්නා සේ- කළ සැළි ආදියෙකින් මැ මැනියැ යුතු වන්නා සේ ලෞකික වූ තර්කයෙකින් ලොකොත්තර වූ නිර්වාණය මැනැ බලා තීරණයට පැමිණියැ හැකි නො වේ. ලොකොත්තර වූ ප්‍රඥාචක්‍ෂුසින් තමන් විසින් මැ ප්‍රත්‍යක්‍ෂයෙන් දක්නා මැ තීරණය කටැ යුතු වේ. තමන්

ගේ ලෞකික තර්ක ශර ප්‍රහාරයට=හීපහරට) ලක් නො වන තාක් හැම දෑ, තමන් නුදුටු නොවිඳි තාක් දෑ 'නැතැ'යි කීම ජාත්‍යන්ධයන්ගේ චක්ෂුසූර්‍ය්‍යාදි ආලෝකය වත්- වර්ණ සංස්ථාන ඇත්තා වූ රූප වත් නැතැ යි කීම වැනි වේ. එ බැවින් මෙ බන්දක් ස්ඵුට කිරීමෙහිදී **"ආගමසිද්ධි යැ- න්‍යායසිද්ධි යැ හෝ යුක්තිසිද්ධි යැ- අනුමානසිද්ධි යැ- ප්‍රත්‍යක්ෂසිද්ධි යැ"**යි සාධනෝපායයෝ (=ඔප්පු කරන මාර්ගයෝ) සතර දෙනෙකි. එයින් ආගමසිද්ධිය නම්: ආගමයෙහි ශාස්තෘන් වහන්සේ වදාළ බැවින් ම අවිවාදයෙන් තීරණයට පැමිණීම යි. අප ශාස්තෘන්වහන්සේ විසින් **"අත්ථි භික්ඛවෙ අජාතං අභූතං අකතං අසංඛතං"** යි (=මහණෙනි! යම් දිනෙකැ උත්පාදවස්ථායෙකින් නූපන් බැවින් 'අජාත' නම් වූ-ආකස්මිකවැ (=කරුණු නැති වැ) පහළ නුවූවක් බැවින් 'අභූත' නම් වූ- දෙව බ්‍රහ්මාදි යම් කිසි ඊශ්වරයකු විසින් නොමවන ලද බැවින් 'අකත' නම් වූ- නොයෙක් හේතු ප්‍රත්‍යය සමවායයෙකින් නො සකස් කැරුණු හෙයින් (=පිළියෙළ නොකැරුණු හෙයින්) 'අසංඛත' නම් වූ නිත්‍ය ශාන්ත සුඛ තත්ත්වයෙක් (=නිවනෙක් ඇත්තේ ම යැ යි වදාරන ලද්දේ ය. වෙන ත් අනෙක සූත්‍රශතයන්හි දු නිවන් ඇති බව ම වදාරන ලද්දේ ය. නොයෙක් රහතන් විසිනු දු **"අත්ථි නිස්සරණං ලොකෙ- පඤ්ඤාය මෙ ඵුසිතං"** (=මා විසින් නුවණින් ස්පර්ශ කරන ලද හෙවත් ලොවුතුරු මඟ නුවණැසින් ප්‍රත්‍යක්ෂ කොටැ දක්නා ලද නිවන් නම් දෙයෙක් ඇත්තේ මැ යැ-) යන ආදීන් නොයෙක් තන්හි කියන ලද්දේ යැ. එ බැවින් නිවන් ඇති බව භක්තජනයනට **ආගම සිද්ධියෙනු දු සිද්ධ මැ යැ.**


**න්‍යාය සිද්ධිය නම්:** යුක්ති දැක්වීමෙන් ඔප්පු කිරීම යැ. ඉදින් නිවන් නම් දෙයක් නැතහොත් ඒ නිවන් ම අරමුණු කොට ගෙන පහළ වන සතර මඟ සතර පල සිත් නූපදිති. ඔවුන් නූපදුණොත් බුදුහු රහත්හු නො ලැබියැ යුතු වෙති. එහෙත්, ඔවුන් වහන්සේ වැඩැ උන් බව ඉතිහාසාදියෙන් සිද්ධාන්ත යැ. අනෙක් යුක්තීන් තබා මේ එක යුක්තියෙන් ම නිවන් ඇති බව **න්‍යාය සිද්ධියෙනුදු සිද්ධ මැ යැ.**

**අනුමාන සිද්ධිය නම්:** ප්‍රත්‍යක්ෂ වූ දෙයකට සමාන කොටැ මැනැ බැලීමෙන් අප්‍රත්‍යක්ෂ වූ දෙයෙහි තීරණයට පැමිණීම යැ. සුමෙධ පණ්ඩිතයන් නිවන් නම් දෙයක් ඇතැ යි තීරණයට පැමිණියේ මේ සිද්ධියෙනි. දුක් නම් වූ දෙයක් ඇති කල්හි එයට ප්‍රතිපක්ෂ වූ- ඉදුරුම විරුද්ධ වූ සුව නම් වූ දෙයකු ත්- උෂ්ණය ඇති කල්හි තත්ප්‍රතිපක්ෂ වූ සිහිලකු ත්- අඳුරු ඇති කල්හි

තත්ප්‍රතිපක්ෂ වූ එළියකු ත් ඇති බව අපට ප්‍රත්‍යක්ෂ යෑ. ඊට අනු වැ සජරාමර වූ සසරක් ඇති කල්හි අජරාමර වූ නිවනකු ත් ඇති විය යුතු යැ- යන ආදීන් සිතා බලනුවනට **අනුමාන සිද්ධියෙනු දු නිවන් ඇති බව සිද්ධ මැ යැ.** මහනුවණැසින් තමන් ම නිවන් දක්නා බුද්ධාදි ආර්‍යයනට ප්‍රත්‍යක්ෂ සිද්ධියෙනු ත් නිවන් ඇති බව සිද්ධ මැ යි. මෙසේ ආර්‍යයනට ප්‍රත්‍යක්ෂයෙන් අවබොධ වශයෙනු ත් සෙස්සනට ඉතරත්‍රයයෙන් (=අනෙක් සිද්ධි තුනින්) **අනුබොධ** වශයෙනුත් නිවන් ඇති බව නම් සිද්ධ මැ යි. එ බැවින් ලොකාමිෂ ග්‍රථිත වූ ශුෂ්ක තාර්කිකයන්ගේ නිගමනයෝ මේ සූක්ෂ්මතම ලොකොත්තර ධර්‍ම විවෙචනයෙහිලා ප්‍රමාණ නොවෙති යට කී නියෙන් නිවන් දක වදාළ බුදුන් රහතන් නිර්‍වාණ ස්වරූප නිරූපණයෙහි උදාසීන වූවාක් මෙන් ම මිළිඳු පැණෙහි නාගසේනයන් වහන්සේ ද හැම අටුවා ඇජරහු ද උපෙක්ෂක වූහ. අප වැනි පුහුදුන්හු කෙසේ නම් නුදුටු නිවන් වැනීමෙහි නිස්සෝ ද? නො නිස්සෝ මැ යි.

**හැම සත්හු සුවපත් වෙත්වා!**

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු